සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

ඉතිහාසය I පත්‍රය
History Paper I

පැය එකයි
One Hour

සැලකිය යුතුයි.

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80කි.

II. අංක 1-40 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

III. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ ( ලකුණ යොදන්න.

---

1) පාළි භාෂාවෙන් අර්ථ විවරණය කිරීම සඳහා ලියන ලද " වංසත්ථප්පකාසිනි" යනුවෙන් හැඳින්වෙන ටීකාව ලියවුණේ කිනම් මූලාශ්‍රය වෙනුවෙන්ද ?

I. ධාතුවංසය
II. මහාවංසය
III. දීපවංසය
IV. උත්තර විහාර අට්ඨ කථා

2) මහාවංසයේ මුල් කොටසින් දක්වා ඇත්තේ

I. බුදුන් වහන්සේගේ ලංකා ගමනයේ සිට මහසෙන් රාජ්‍ය කාලය දක්වා .
II. විජය කුමාරයාගේ කාලයේ සිට මහසෙන් රජ දක්වා
III. පණ්ඩුකාභය රජුගේ කාලයේ සිට මහසෙන් රජුගේ රාජ්‍ය කාලය දක්වා
IV. බුදුන් වහන්සේගේ ලංකා ගමනයේ සිට අනුරාධපුර රාජධානිය බිඳවැටීම දක්වා

3) X තීරුවේ විදේශ මූලාශ්‍රයන් ද y තීරුවේ එම අදාළ පුද්ගලයන් ද දැක්වේ. X හා y තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| X | y |
|---|---|
| 1. පෘතුගීසී මූලාශ්‍රය | A. බැල්දියස්ගේ ලංකා පුරා වෘත්තය |
| 2. ඉංග්‍රීසි මූලාශ්‍රය | B. ඉබන්බතුතාගේ දේශාටන වාර්තා |
| 3. චීන මූලාශ්‍රය | C. රොබට් නොක්ස්ගේ එදා හෙළදිව |
| 4. ඕලන්ද මූලාශ්‍රය | D. රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය |
| | E. හියුංසියැං හිමිගේ දේශාටන වාර්තා |

I. DCEA  II. BEDC  III. DECA  IV. ACED

252

4) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් කඳවුරු හා ගල්ගුහා ලංකාවේ විවිධ දේශගුණික කලාපවල ව්‍යාප්තව තිබූ බව දැක්වෙන අතර වෙරළාශ්‍රිත , පහතරට තෙත් , පහතරට වියළි, කඳුකර ප්‍රදේශවලට අදාළ නිවැරදි පිළිතුර වන්නේ

I. බූන්දල, බටදොඹ ලෙන, පොතාන, කිතුල්ගල
II. මිනිහා ගල් කන්ද, පාහියන්ගල, අලිගල, හෝර්ටන්තැන්න
III. බණ්ඩාරවෙල, සිගිරිය,කිතුල්ගල, බූන්දල
IV. පතිරාජවෙල, අලිගල,කිතුල්ගල, බණ්ඩාරවෙල

5) පූර්ව ඓතිහාසික යුගයේ ස්ථිරවාසිතාවට සාක්ෂි සොයාගත් ස්ථානයක් ලෙස සැලකෙන්නේ

I. බෙරගල
II. උඩරංචාමඩම
III. නිකවලමුල්ල
Iv. කලබටුවාව

6) මැටි බඳුනක භෂ්මාවශේෂ තැන්පත් කර පොළොවේ වල දැමීම හැඳින්වූයේ කෙසේද?


I. ශිලා මංජුසා
II. මහා ශිලා සුසාන
III. තුම්භිය නිඛනන
Iv. ගල් සොහොන් බිම්

7) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශය වූ පූර්ව රාජ්‍ය සමයේදී විවිධ ආකාරයෙන් දැරූ තනතුරු කිහිපයක් පහත දැක්වේ. X හා Y ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| X | y |
|---|---|
| 1. සැම පවුලකම ප්‍රධානියා | A. තොටබොජක |
| 2. ගම්වල ජීවත් වූ ගම් ප්‍රධානින් | B. පරුමක |
| 3. ප්‍රදේශයක් පාලනය කරන්නා | C. ගහපති |
| 4. තීර්ථය අනුභව කරන්නා | D. ගමික |

I. BACD
II. CADB
III. DBCA
IV. CDBA

8) යාබද රූපසටහනේ පෙන්නුම් කර ඇත්තේ



I. ගංගා පද්ධතිය
II. වැව් ප්‍රපතනය
III. ගංගා වැව් පද්ධතිය
IV. ඇළ පද්ධතිය

9)

- අනුරාධපුරය සිය අගනුවර ලෙස ලෙස තෝරා ගැනීම
- තම දසවෙනි රාජ වර්ෂයේදී ග්‍රාම සීමා නියම කිරීම
- චණ්ඩාල කුලවල පිරිස් සොහොන් බිම් නඩත්තු කටයුතු වලට යෙදවීම

මෙම සිදුවීම් වලට අදාළ රජතුමා වන්නේ කවුද?

I. පණ්ඩුකාභය
II. වළගම්බා
III. දේවානම්පියතිස්ස
Iv. දුටුගැමුණු

10) යාපන ප්‍රදේශය සෘෂිගිරි නම් ඇමතිවරයෙකු පාලනය කළ බව වල්ලිපුරම් රන් සන්නසේ දක්වා තිබෙන අතර එකල සිටි පාලකයා වන්නේ

I. මහසෙන් රජ
II. පණ්ඩුකාභය රජ
III. I පරාක්‍රමබාහු රජ
Iv. වසභ රජ



253

11) රෝමානු කතෝලික ආගම ඇදහූ උගතුන්ට තවදුරටත් එම නගරයේ ජීවත්වීම අපහසු වීම නිසා යුරෝපා රටවලට පලා ගියේය. මෙහි සඳහන් වූ නගරය වන්නේ

I. ෆ්ලොරන්ස් II. වැනිසිය
III. කොන්ස්තන්තිනෝපලය IV. ජිනෝවා

12) මධ්‍යතන යුගය වන විට පාප් වහන්සේ හා ක්‍රිස්තියානි පල්ලිය සතුව විශාල බලයක් විය. කතෝලික සභාවට විරුද්ධව කටයුතු කළ අය හා ඔවුන්ගේ රටවල් X හා y තීරුවල දැක්වේ.එම තීරු දෙක ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| X | y |
|---|---|
| 1. ජෝන් වයික්ලිෆ් | A. ජර්මනිය |
| 2. ඉරස්මස් | B. බොහිමියාව |
| 3. මාටින් ලූතර් | C. ප්‍රංශය |
| 4. ජෝන් හස් | D. තුර්කිය |
| | E. එංගලන්තය |

I. DBCE II. ECAB III. ECDB IV.BCAD

13) රජවරුන්ගේ ක්‍රියා කලාපය හා පෙනී සිටීමට උත්සහ කළ ආකාරය අනුව විවිධ සංකල්ප ගොඩනැලී ඇත. ඒ අනුව දේවත්වය, පර්වත රාජ චක්‍රවර්ති වැනි රාජ්‍යත්වය පිළිබඳ සංකල්ප වලට අදාළ පිළිතුර තෝරන්න.

I. පණ්ඩුකාභය, කාශ්‍යප, I පරාක්‍රමබාහු
II. මහසෙන්, කාශ්‍යප, නිශ්ශංකමල්ල
III. කුටකණ්ණ අභය, මහසෙන්, නිශ්ශංකමල්ල
IV. කාශ්‍යප, මහසෙන්, I පරාක්‍රමබාහු



14) ශ්‍රී ලංකාවේ තානාපතිවරයෙක් රෝමයට ගොස් රතු පබළුගෙනවිත් රුවන්වැලි සෑය සරසා ඇත.එසේ කර ඇත්තේ යාබද පිංතූරයේ දැක්වෙන රජතුමාගේ කාලයේදීය. ඒ රජතුමා වන්නේ

I. දුටුගැමුණු II. මහසෙන්
III. භාතිකාභය IV. සද්ධාතිස්ස

15) කාර්මික විප්ලව සමයේදී සොයා ගැනීම් කළ පුද්ගලයන්ගේ නම් x තීරුවේද ඔවුන්ගේ සොයා ගැනීම් y තීරුවේද දැක්වේ. x තීරුවේ දැක්වෙන පුද්ගලයා y තීරුවේ දැක්වෙන සොයාගැනීම් හා ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| X | y |
|---|---|
| 1. ජෝජ් ස්ටීවන්සන් | A. මෝටර් රථය |
| 2. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් | B. දුම්රිය එංජිම |
| 3. සැමුවෙල් මෝස් | C. දුම් බෝට්ටුව |
| 4. ඩේම්ලර් | D. දුරකථනය |
| | E. විදුලි පණිවිඩ ක්‍රමය |

I. ECDB II. BECA III. BDEA IV. ACDE

16) දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණා ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිඟයක් නිසා මෙරට නිපදවන ධාන්‍ය වලට වැඩි ඉල්ලුමක් ඇති වූයේ කිනම් රජතුමාගේ කාලයේදී ද?

I. වසභ II. මහසෙන්
III. I පරාක්‍රමබාහු IV. දුටුගැමුණු

17) ඉන්දියාවේ නැගෙනහිර කොටසට මුහුණ ලා පිහිටි ත්‍රිකුණාමල වරායේ වෙළඳ කටයුතු පාලනය කිරීමට පොළොන්නරුවේ සිට පාලනය මෙහෙයවීම වැදගත් යයි සැලකූ පාලකයා වන්නේ

I. දුටුගැමුණු රජතුමා
II. I පරාක්‍රමබාහු රජතුමා
II. වසභ
Iv. I විජයබාහු

18) රෙදි විවීම තරමක් වේගවත් කරගැනීමට හැකිවූයේ දුවන නඩාව නිපදවීම නිසයි.මෙය නිපදවනු ලැබුයේ

I. රිචඩ් ආක්රයිට්
II. ජේම්ස් හාග්‍රීව්ස්
II. ජෝන් කේ
Iv. සැමුවෙල් ක්‍රොම්ප්ටන්

19) පොළොන්නරුවේ I විජයබාහු රජතුමා දළදා මාලිගාවේ ආරක්ෂාව සඳහා පත්කරනු ලැබූ ආරක්ෂකයින් වන්නේ

I. ලස්කිරිඤ්ඤ හමුදාව
II. අගම්පඩි හමුදාව
II. වෙලයික්කාර හමුදාව
Iv. පාණ්ඩ්‍ය හමුදාව

20) " කැති අඩ , කෙටු කනබ අය" යන බදු වර්ග අහෝසි කළා යයි සැලකෙන රජතුමා වන්නේ

I. වසභ
II. නිශ්ශංකමල්ල
II. I විජයබාහු
Iv. I පරාක්‍රමබාහු

21) පහත x හා y ලෙස දක්වා ඇත්තේ විවිධ වෘත්තීන්හි නිරත වන ශිල්පි නාමයන්ය.ඒවා එකිනෙක ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| X | y |
|---|---|
| 1. යකඩ වැඩ කළ කම්කරුවන් | A. දවික |
| 2. තඹ ලෝහ කරුවන් | B. තුලාදර |
| 3. රන් කරුවන් | C. කබර |
| 4. ඇත් දළ කැටයම් කරුවන් | D. තබකර |

I. CDBA II. BACD III.DACB IV. ADCB

22) කාර්මිකරණයේ ප්‍රධානම සමාජ ප්‍රතිඵලයක් වුයේ කුමක් ද?

I. වෙළඳ සමාගම් බිහිවීම
II. පන්ති සමාජයක් බිහිවීම
III. සේවක වැඩ වර්ජන ඇතිවීම
Iv. කාර්මික නිෂ්පාදන පුළුල් වීම

23) කාලසුමන, අබලවපර, පුගය යන වචන භාවිතා කර ඇත්තේ කිනම් වෘත්තීන් වෙනුවෙන්ද?

I. මැණික් කර්මාන්තය
II. හේන් වගාව
III. ගොවිතැන
Iv. වෙළෙඳාම

24) හෝපිටිගම වෙළෙඳපලේ පොහොය දින වල වෙළඳාම් කළ අයට දඩයක් ලෙස මහියංගන විහාරයේ පහන් දැල්වීමට තෙල් ලබා දිය යුතුයයි සඳහන් වන වැම් ලිපිය වන්නේ

I. සොරබොර වැව
II. ගොඩවාය
III. මිහින්තලා
Iv. වෙලයික්කාර



255

25) වැවක ජලය පිරී ඇති විට සුළඟ හා ජලයේ චලිතය නිසා තරංග ඇති වේ. තරංග වලින් වැව් බැම්ම බාදනය වීම වැලැක්වීමට සකස්කර ඇත්තේ

I. බිසෝකොටුව II. සොරොව්ව
III. රළපනාව Iv. වාරිමාර්ග ඇළ

26) "යකඩ නිස්සාරණ තාක්ෂණය " යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක්ද?

I. ස්වාභාවික සුළං බලය යොදා යකඩ වෙනස් කර ගැනීම
II. යකඩ බහුල ගල් සඳහා අධික උෂ්ණත්වයක් යොදවා යකඩ ලෝහය වෙන් කර ගැනීම
III. ස්වභාවික උෂ්ණත්වය මගින් යකඩ බහුල ගල් රත් කිරීම
IV. අධික උෂ්ණත්වය හා සුළං මගින් යකඩවල පවතින ජලය ඉවත් කිරීම

27) වැවේ ජලකඳ ඉහළ යාම නිසා අධික පීඩනයක් නිර්මාණය වේ.එම පීඩනය අවම කිරීමට උදව් වන්නේ

I. වැව් බැම්ම II. බිසෝකොටුව
III. මොහොල Iv. සොරොව්ව




- 28 සිට 30 දක්වා ප්‍රශ්න වලට ලංකා සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

28) විදේශ වලින් භාණ්ඩ අපනයනය කිරීමේදී වරාය වලදී එකළ රේගු බදු අය කෙරිණි. එවැනි බදු අය කළ ස්ථානයක් ලෙස සැලකෙන ගොඩවාය වරාය දක්වා ඇත්තේ

I. D II. A III.C IV. B

29) I ගජබාහු රජු පිහිටුවන ලද මහාඅධිකරණයක් පිළිබඳ සිතුල්පව්ව සෙල් ලිපියක දැක්වේ. එම සෙල්ලිපිය පිහිටා ඇති සිතුල්පව්ව දැක්වෙන්නේ

I. D II. E III.G IV. F

30) IV උදය රජතුමා රජයේ වෙළෙඳපලක සිදුවන අකටයුතු වලක්වාලමින් පනවන ලද නීති සමුදායක් අඩංගු සෙල්ලිපිය තිබෙන සොරබොර දක්වා ඇති අක්ෂර වන්නේ

I. E II. H III.G IV. F

31) වසර 9 කාලයක් පොළොන්නරුවේ පාලනය ගෙන ගිය කාලිංග වංශික පාලකයා වූයේ කවුද?

I. කාලිංග මාඝ II. I විජයබාහු
III. නිශ්ශංකමල්ල Iv. වීරබාහු

32) II පරාක්‍රමබාහු රජ සමයේ එතුමාට මුහුණ දීමට සිදු වූ ආක්‍රමණිකයන් දෙදෙනා වන්නේ

I. කාලිංගමාඝ, කාලිංගරායාර II වෝඩාංග , කාලිංග මාඝ
III. චන්ද්‍රභානු, ආර්ය චක්‍රවර්ති IV කාලිංගමාඝ, චන්ද්‍රභානු



256

33) බුදු දහමේ උන්නතිය වෙනුවෙන් හා අධ්‍යාපන, ශාස්ත්‍රීය අංශයට සිදු වූ වැදගත් සේවයක් ලෙස පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය වීම සැලකිය හැක. මෙකල සිටි පාලකයා වන්නේ

I. Iv පරාක්‍රමබාහු
II. II බුවනෙකබාහු
III. III බුවනෙකබාහු
Iv. III පරාක්‍රමබාහු

34) ගම්පොළ යුගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි අරාබි සංචාරකයා වන්නේ

I. සුලයිමාන්
II. ඉබන්බතූතා
III. අබුසයිත්
Iv. ආර්ය චක්‍රවර්ති

35) ලෞකික රසවින්දනය සඳහා ස්වභාවිකත්වයට මුල් තැන දී නිර්මාණ බිහිවීම ඇතිවූයේ

I. මධ්‍යතන යුගයේදී ය.
II. පුනරුද යුගයේදී ය.
III. නූතන යුගයේදී ය.
Iv. අඳුරු යුගයේදී ය.

36)

- වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කර ගැනීම
- සපුමල් කුමරු ලවා යාපනය ජයගැනීම
- උඩරට ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩපැවැත්වීමට කටයුතු යෙදීම

මෙවැනි විශාල කාර්යය සමුදායක් ඉටුකළ කෝට්ටේ පාලකයා වූයේ

I. I පරාක්‍රමබාහු
II. II පරාක්‍රමබාහු
III. IV පරාක්‍රමබාහු
Iv. VI පරාක්‍රමබාහු

37) පෘතුගීසින්ගෙන් හා ඉන්දියාවේ සැමොරින් පාලකයන්ගෙන් උදව් ලබා ගත් පාලකයන් දෙදෙනා වන්නේ

I. I විමලධර්මසූරිය, I රාජසිංහ
II. VII බුවනෙකබාහු , මායාදුන්නේ
III. VII බුවනෙකබාහු , I රාජසිංහ
IV. VI විජයබාහු , මායාදුන්නේ

38) බ්‍රිතාන්‍යයේ නාවික , ගුවන් හා සෙසු යුධ කටයුතු සඳහා මෙරට භූමිය භාවිත කිරීමට ඉඩ ලබාදෙන ගිවිසුමක් බ්‍රිතාන්‍ය රජය සමඟ D.S. සේනානායක මහතා අත්සන් කළේ කිනම් වර්ෂයේදී ද?

I. 1941  II. 1947  III.1946  IV. 1948

39)

❖ අග්‍රාණ්ඩුකාරධුරය
❖ පාර්ලිමේන්තුව
❖ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
❖ අධිකරණය

යන ආයතන හඳුන්වා දුන් ආණ්ඩුක්‍රමය වන්නේ

I. මැකලම් ප්‍රතිසංස්කරණ
II. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
III. මැනිං ප්‍රතිසංස්කරණ
Iv. සෝල්බරි ප්‍රතිසංස්කරණ

40) විධායක ජනාධිපතිධුරයකින් යුක්ත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරනු ලැබුයේ කිනම් වර්ෂයේදීද?

I. 1931  II. 1948  III.1972  IV. 1978

(ලකුණු 2 X 40=80)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ඉතිහාසය II පත්‍රය<br>History Paper II | පැය තුනයි<br>Tree Hours |

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 කට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

---

1)

පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම දී ඇති ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

(අ)

I. පොළොන්නරුව , කදුරුගොඩ, සීගිරිය, රංවාමඩම , කලාවැව, සල්වාතොට, පල්ලවංක වලගේ ගහ, මිණිපේ ඇළ, කොළඹ, කල්පිටිය මඩකලපුව (ලකුණු 12)

II. ප්ලොරන්ස්, කැලිකට්, සුමාත්‍රා, පොන්ඩිචෙරි, පෘතුගාලය, මධ්‍යධරණි මුහුද (ලකුණු 6)

(ආ) පහත ABCD යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් / රටවල් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. 1818 පළමු නිදහස් අරගලයේදී රාජ්‍ය උරුමයක් ඇතැයි පැවසූ තැනැත්තා.
B. ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රජතුමා
C. දේශ ගවේෂණ කටයුතුවලට විශාල අනුග්‍රහයක් ලබා දුන් නාවික හෙන්රි කුමාරයා අයත් රට
D. ප්‍රථමයෙන් ගුවානෝ පොහොර නිපදවූ රට (ලකුණු 4)

(ඇ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


(A)



1. A වලින් දැක්වෙන පින්තූරය නම් කරන්න
2. මෙය සොයා ගෙන ඇති ස්ථානයේ නම ලියන්න
3. එම ස්ථානය ගොඩනගා ඇත්තේ කිනම් රජතුමා සිහිවීම සඳහා ද?
4. පහනේ තෙල් පිරිමට යොදාගෙන ඇති මූලධර්මය කුමක්ද?

(ලකුණු 4)

(B)



1. B පින්තූරයේ දැක්වෙන පුද්ගලයාගේ නම ලියන්න
2. ඔහු කළ නිර්මාණය කුමක්ද?
3. එම නිෂ්පාදනය කළ වර්ෂය කුමක්ද?
4. එම නිර්මාණය වැදගත් වූයේ කිනම් කටයුතු සඳහාද?

(ලකුණු 4)

## II කොටස

2) i) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක 3ක් දක්වන්න. (ලකුණු 3)

ii) පහත දැක්වෙන ජනාවාසවල සිටි වෘත්තිකයන් නම් කරන්න.

1. මණිකාරගම
2. කේවට්ටග්‍රාම
3. වඩ්ඪකිගාම
4. කුම්භකාර ගාම

(ලකුණු 4)

iii) පූර්ව රාජ සමයේදී පරුමකවරුන් කළ සේවා 2ක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

iv) "දේවානම් පියතිස්ස රාජ්‍ය සමය ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයට හේතුවිය" කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

3) I) රාජ්‍යත්වය පිළිබඳ ප්‍රධාන සංකල්ප 3ක් දක්වන්න. (ලකුණු 3)

ii) දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසු රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ වූ පහත දැක්වෙන නිලධාරීන්ට අදාළ කාර්යය අනුපිළිවෙලින් ලියන්න.

1. රූප අදෙක
2. නගර වුඩික
3. කහා පෙඩික
4. බතගු

(ලකුණු 4)

iii) " ශ්‍රී ලංකාවේ දේශපාලන බලයට ශක්තිමත් පදනමක් වැටුණේ දුටුගැමුණු රජතුමාගෙනි". එතුමාගේ දේශපාලන & ආගමික ක්‍රියා කලාපය පිළිබඳ නිදසුන බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 5)

iv) " ලංකා ඉතිහාසය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේ පොළොන්නරුවේ I විජයබාහු රජතුමායි" . උදාහරණ සහිතව කරුණු 3ක් ඇසුරෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 6)

4) I) ශ්‍රී ලංකාවේ දෙවන නාගරිකරණ ක්‍රියාවලියේදී නිරිත දිගින් බිහිවූ ආරම්භක නගර 3 අනුපිළිවෙළින් නම් කරන්න.

(ලකුණු 3)

II) පහත දක්වා ඇත්තේ බද්දේ සංවිධානය භාවිත වූ බදු වර්ග කිහිපයකි.ඒවායේ කාර්ය භාරය දක්වන්න.

1. කුරුවේ බද්ද
2. රදා බද්ද
3. බඩහැල බද්ද
4. හැඳ බද්ද

(ලකුණු 4)



259

III) I විමලධර්මසූරිය රජතුමා උඩරට රාජ්‍යය සිය නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට ගත් ක්‍රියා මාර්ග 2ක් දක්වමින් ඒ කොතරම් දුරට රාජ්‍යයේ දියුණුවට හේතු වී දැයි විස්තර කරන්න. (ලකුණු 5)

IV) මහනුවර රාජධානියේ ආර්ථිකය පිළිබඳව කරුණු 3ක් ඔස්සේ තොරතුරු ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 6)

5) i) පහත දක්වා ඇත්තේ බටහිර ජාතීන් සම්බන්ධ වූ සිදුවීම් කිහිපයකි. එම සිදුවීම් වලට අදාළ වර්ෂ දක්වන්න.

a. පෘතුගීසි ජාතික ලොරෙන්සෝ අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණීම
b. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීම
c. වස්කොද ගාමා ඉන්දියාවට පැමිණීම

(ලකුණු 3)

ii) පහත දැක්වෙන ස්ථාන වලදී ඇති වූ සටන් වලට මුල් වූ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරු නම් කරන්න.

1. දන්තුරේ
2. බලන

(ලකුණු 4)

iii) ක්‍රි.ව. 1638 ගිවිසුම හෙවත් වෙස්ටර් වෝල්ඩ් ගිවිසුමේ කොන්දේසි 2 ක් දක්වමින් ලන්දේසින් ඒ අනුව ක්‍රියා කළේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 5)

iv) උඩරට රාජ්‍ය හා රජු සම්බන්ධයෙන් ලන්දේසින් ක්‍රියාකළ ආකාරය කරුණු 2ක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 6)

6) i. උඩරට රාජ්‍ය පාලනය කළ නායක්කාර් වංශික රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

ii) විදේශ ආධිපත්‍යයට එරෙහිව උඩරට රාජ්‍යයේ ඇති වූ බ්‍රිතාන්‍ය විරෝධී සටන් ව්‍යාපාර 2 ඇතිවූ වර්ෂ නම් කරන්න.

(ලකුණු 4)

iii) "කෝල්බෲක් ප්‍රතිසංස්කරණ දෙවන නිදහස් සටනට හේතුවී ඇත " කරුණු 2ක් දක්වමින් පැහැදිලි කරන්න

(ලකුණු 5)

iv) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේදී හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙන් සිදුවූ සේවාවන් 3 ක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න.

(ලකුණු 6)

7) I) 1947 සිට 1972 දක්වා ශ්‍රී ලංකාවේ සිටි අග්‍රාමාත්‍යවරු තිදෙනෙක් නම් කරන්න (ලකුණු 3)

ii) පහත දැක්වෙන තනතුරුවලට මුල් වූ පුද්ගලයන් නම් කරන්න

a. ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා
b. ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය
c. ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමික ජනාධිපතිවරයා
d. ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති

(ලකුණු 4)

iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකම් 2ක් දක්වා ඒවා බිඳවැටුන විට එම අයිතිවාසිකම් ආරක්ෂා ක[illegible] ගැනීමට ගත හැකි පියවර 2 පැහැදිලි කරන්න (ලකුණු 5)

iv) මුළු රටම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන අවස්ථා 2ක් දක්වා ඒවා එකිනෙක පැහැදිලි කරන්න (ලකුණු 6)

## III කොටස

8) i) කාර්මික විප්ලවය නිසා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් 3 ක් දක්වන්න (ලකුණු 3)

ii) සමාජයට කාර්මික විප්ලවය තුළින් ඇති වූ අහිතකර ප්‍රතිඵල 4ක් දක්වන්න (ලකුණු 4)

~~iii) බ්‍රිතාන්‍යයේ පළමුවෙන්ම කාර්මික විප්ලවය ආරම්භ වීමට බලපෑ හේතු 2ක් දක්වමින් විස්තර කරන්න (ලකුණු 5)~~

iv) “ කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වන විට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයකි”. ඔවුන් ශ්‍රී ලංකාවේ ඇති ක
වෙනස්කම් කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

9) i) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 3ක් දක්වන්න. (ලකුණු 3)

ii) පහත දැක්වෙන දෑ වලට පුනරුද සමයේ දායක වූ පුද්ගලයන් නම් කරන්න

1. මොනාලිසා
2. ගුරුත්වාකර්ෂණය
3. අවසාන විනිශ්චය
4. පෘතුවියේ ගෝලාකාර බව

(ලකුණු 4)

iii) පුනරුදය නිසා ඇති වූ දේශපාලන දියුණුව කරුණු 2ක් යටතේ විස්තර කරන්න (ලකුණු 5)

iv) “ලොව වෙනස්කම් ඇති කරමින් සමාජ පරිවර්තනයක් ඇති කිරිමට පුනරුදය හේතු විය” කරුණු 3ක් යටතේ විස්තර කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 6)

මුස්ලිම් පාසල් සිසුන් සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී ප්‍රශ්න අංක 10, 11 ප්‍රශ්න [illegible] පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

10) i) පහත දැක්වෙන්නේ බදු නීතිය යටතේ අය කළ බදු වර්ග කිහිපයකි. එම බදු අය කළේ කුමක් සඳහා දැයි පිළිවෙළින් ලියන්න.

a. දකපති

b. මතරමජිබක

c. බොජකපති

(ලකුණු 3)

ii) බදුලු ටැම් ලිපිය හෙවත් සොරබොර වැව ටැම් ලිපියේ සඳහන් වන වෙළෙඳපල නීති 2ක් ලියන්න. (ලකුණු 4)

iii) වැවක අංග රාශියක් ඇත. ඉන් බිසෝකොටුව හා රළපනාව පිළිබඳව වෙන වෙනම විස්තර කරන්න. (ලකුණු 5)

iv) පැරණි වාස්තු විද්‍යාත්මක නිර්මාණයේදී තාක්ෂණය භාවිත කළ ආකාරය උදාහරණ 3ක් ඇසුරෙන් විස්තර කරන්න (ලකුණු 6)


11) i) මිනිස් භෂ්මාවශේෂ සහිත වළං සුසාන ගර්භය තුළ තැන්පත් කළ ශිලා මංජුසා සොහොන් 3ක් නම් කරන්න. (ලකුණු 3)

ii) උඩරංවා මඩමේ නිවාසයකින් සොයාගෙන ඇති කාන්තා රූ සපු අලංකාරය සඳහා භාවිතා කර ඇති ද්‍රව්‍ය 2ක් දක්වන්න (ලකුණු 4)

iii) පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව පිළිබඳ කරුණු 2ක් ඉදිරිපත් කර විස්තර කරන්න. (ලකුණු 5)


iv) මහශිලා සුසානභූමි භාවිත කර ඇත්තේ පූර්ව ශිලා යුගයේදී ය. මෙම ශිලා භූමිවල දක්නට ලැබුණ ලක්ෂණ 2ක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 6)

264



263

b.



7264